රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 352

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1986 නොවැම්බර් මස 20 වැනි දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

හදිසි අනතුරු තුවාල හා විශේෂ අසනීප නිවාඩු -
ආයතන සංග්‍රහය - XII වන පරිච්ඡේදය.

කරුණාකර 9 වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරන්න.

"9. හදිසි අනතුරු තුවාල හා විශේෂ අසනීප නිවාඩු.

9:1 හදිසි අනතුරු තුවාල

9:1:1 - ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන හෝ නොදරන හෝ (හමුදා නිලධරයෙකු හෝ පොලිස් නිලධරයෙකු නොවන) රජයේ නිලධාරියෙකුට හෝ අධිකරණ නිලධාරියෙකුට,

(අ) ඔහුගේ රාජකාරි ඉටු කිරීමේදී,

හෝ (ආ) ඔහු රාජකාරි ඉටු නොකරන අවස්ථාවකදී වුවද, ඔහුගේ සාමාන්‍ය රාජකාරිවල විෂය සීමාව ඇතුළත වූ යම් ක්‍රියාවක් කිරීමේදී,

හෝ (ඇ) ඔහුගේ රාජකාරි කටයුතු ඉටු කිරීමෙහිලා යම් ක්‍රියාවක් කිරීමෙහි ප්‍රතිඵලයක් වශයෙන්,

හෝ (ඈ) (I) ඔහුගේ වාසස්ථානයේ සිට රාජකාරි සඳහා වාර්තා කිරීමට පිහිය සේවා ස්ථානය දක්වා,

හෝ (II) රාජකාරියෙන් පසු ඔහුගේ සේවා ස්ථානයේ සිට වාසස්ථානය දක්වා හෝ යන ගමනකදී,

හෝ (ඉ) සේවා ස්ථානයේ සිට රාජකා රි කටයුතු වල නිරතවීම සඳහා යන ගමනකදී සහ සේවා ස්ථානයට ආපසු එන ගමනකදී, හෝ තුවාල සිදුවුවහොත්, හා එසේ තුවාල සිදුවීම

(I) යම් නීතියක් හෝ දෙපාර්තමේන්තු නියමයක් හෝ රෙගුලාසියක් හෝ උල්ලංඝනය වන අයුරින් ක්‍රියා කිරීම නිසා,

හෝ/හා (II) නිලධරයාගේ සහායක නොසැලකිලිමත් භාවය නිසා නොවේ නම්,

එසේ ලෙඩ වූ කාලයේ ස්වභාවය අනුව හා වෛද්‍ය මණ්ඩලයේ නිර්දේශ අනුව, අදාල අමාත්‍යාංශයේ ලේකම්ට, වර්ෂයක් දක්වා වැටුප් සහිත නිවාඩු හා ඉන්පසු මාස හයක් දක්වා අඩ වැටුප් නිවාඩු අනුමත කළ හැකිය.

9:1:2 මෙසේ අනුමත කරන නිවාඩු නිලධාරියාගේ සාමාන්‍ය නිවාඩු වලින් අඩු නොකළ යුතුය.

9:1:3 ඉහත 9:1:1 සඳහන් කර ඇති එක් අවුරුදු නිවාඩුවට අමතරව, තමාට හිමි ලෙඩ නිවාඩු ලබා ගැනීමට නිලධාරියාට අවසර ඇත.

9:1:4 හදිසි අනතුරු නිවාඩු ඉල්ලුම් කළ යුත්තේ 5 වන පොදු ආකෘති පත්‍රයෙහිය.

9:2 විශේෂ අසනීප නිවාඩු.

9:2:1 නියම වශයෙන්ම ස්ථිර රාජකාරි කරමින් සිටියදී යම් නිලධාරියෙකුට රෝගයක් වැළඳුනහොත් හා එසේ එම රෝගය වැළඳුනේ ඔහු නියම වශයෙන් ස්ථිර රාජකාරි කරමින් සිටියදී බවටත්;
ඔහුගේම ප්‍රමාද දෝෂයක් නිසා නොවන බවටත්;
නිශ්චය වශයෙන්ම ඔහුගේ රාජකාරිවල ස්වභාවය හේතුකොට ගෙන බවටත් ;
රජයේ වෛද්‍ය නිලධාරියෙකු ඉදිරිපත් කරන සහතිකයක් පිට අදාළ අමාත්‍යාංශයේ ලේකම්ට සෑහීමකට පත්විය හැකි නම්,

මාස 6 ක් දක්වා වැටුප් සහිත නිවාඩු හා ඉන්පසු මාස 6 ක් දක්වා අඩ වැටුප් නිවාඩු අනුමත කළ හැකිය.

9:2:2 මෙසේ අනුමත කරන නිවාඩු, නිලධාරියාගේ සාමාන්‍ය නිවාඩුවලින් අඩු නොකළ යුතුය."

Siriwardhana

(ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.